## 14. ශීර්ෂය 14 - නීතිපති දෙපාර්තමේන්තුව

-----------------------------------------

### 14.1 විගණන විෂය පථය

---------------------

නීතිපති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 17 දින නීතිපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 14.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 14.3 විගණන නිරීක්ෂණය

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි සඳහන් කර ඇති පොදු නිරීක්ෂණ සහ පහත 14.4 සිට 14.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක AIA/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංකය 01401 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,366,194 ක් වූ අතර එයින් රු.866,051 ක් වසර පහකට අධික කාලයක සිට අය නොවී පැවතුණි.

## 14.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.**

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

## 14.5 කාර්යසාධනය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත දක්වා ඇති අංශ මගින් ඉටු කර තිබුණි.

(අ) අපරාධ නඩු අංශය

(ආ) සිවිල් අංශය

(ඇ) රාජ්‍ය නීති අංශය

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණය

(ඉ) සංස්ථා අංශය

ඊට අමතරව විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකකද ක්‍රියාත්මත වේ.

(අ) මහජන පෙත්සම් ඒකකය

(ආ) ළමා අපචාර නඩු ඒකකය

(ඇ) EER ඒකකය ( හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු)

(ඈ) ආගමන විගමන ඒකකය

ඉහත සඳහන් අංශ හා ඒකක අතරින් සිවිල් අංශය , අපරාධ අංශය හා ළමා අපචාර නඩු ඒකකය යටතේ වර්ෂ 3 ක කාර්යසාධනය සංක්ෂිප්ත කර පහත දැක්වේ.

| | වර්ෂය | | |
|---|---|---|---|
| සිවිල් අංශය | 2011 | 2012 | 2013 |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 2,641 | 2,714 | 2,710 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 176 | 158 | 231 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 2,465 | 5,021 | 7,500 |
| **අපරාධ අංශය** | | | |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 5,464 | 7,176 | 5,221 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 5,029 | 5,451 | 6,474 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 435 | 2,160 | 907 |
| **කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය** | | | |
| විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | 2,460 | 3,372 | 3,836 |
| වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 1,390 | 1,294 | 1,910 |
| වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව | 1,070 | 3,148 | 5,074 |

## 14.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ----------------- | ----------- | --------------- | ----------------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 221 | 176 | 45 |
| (ii) | තෘතියික මට්ටම | 12 | 10 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 167 | 101 | 66 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 233 | 172 | 61 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | 05 | 05 | - |
| | | -------- | --------- | ------- |
| | එකතුව | 638 | 464 | 174 |
| | | ===== | ===== | ===== |

2014 නොවැම්බර් 11 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 45 ක් හා ද්විතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් දෙපාර්තමේන්තුව විසින් පුරවා නොතිබුණි.